# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## Police Media Division

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ. අංකය<br>த.பெ.இ<br>P.O.Box No | 517 | | | ෆැක්ස්<br>தொலை நகல்<br>Fax | 011-2329500 |
| දුරකථනය<br>தொலைபேசி<br>Telephone | 011-2384024<br>011-2395605 | වෙබ් ලිපිනය<br>இணைய தளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E mail | dir.media@police.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | 441 / 2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2022.03.18<br>පැය 0910 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**යතුරුපැදි සමාජයක් විසින් සංවිධානය කරන ලද යතුරුපැදි සවාරියක් සම්බන්ධව.**

Spin Rider Club නැමති පුද්ගලික යතුරුපැදි සමාජයක් මගින් මහරගම අපේක්ෂා රෝහලට සිදු කල මුදල් පරිත්‍යාගයක් සහ කල්පිටිය ප්‍රදේශයේ පාසල් ළමුන් සඳහා පාසල් පොත් සහ උපකරණ බෙදා දීමේ වැඩසටහනකට සමගාමීව යතුරුපැදි සවාරියක් 2022.03.17 වන දින සිට 2022.03.19 වන දින දක්වා මීරිගම සිට කල්පිටිය හරහා ඉන් පසු අනුරාධපුර දක්වා පැවැත්වීමට සංවිධානය කර ශ්‍රී ලංකා පොලිසිය මගින් අවසර ඉල්ලා තිබුණි.

ලියාපදිංචි පුද්ගලික සංවිධානයක් ලෙස සහ සමාජ සේවා කාර්යයකට අදාලව නීත්‍යානුකූලව සිදු කර තිබූ ඉල්ලීමක් බැවින් නියමිත කොන්දේසි වලට යටත්ව අදාල රජයේ ගාස්තු අයකිරීමෙන් පසුව ඒ සඳහා අවසර දෙන ලදී.

ඔවුන් වෙත ලබාදෙන ලද ප්‍රධාන කොන්දේසි අතර සහභාගී වෙන්නන් සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් තිබීම, නියමිත පරිදි ආරක්ෂක හිස් වැසුම් පැළඳ සිටීම, යතුරුපැදි ලියාපදිංචිය සහ රක්ෂණය කර තිබීම, යතුරුපැදි නියමිත ධාරිතාව නොඉක්මවීම, සියළුම මාර්ග නීති රීති වලට අවනතව ධාවනය, ආරක්ෂාව පිළිබඳ පූර්ණ වගකීම සංවිධායක මණ්ඩලය දැරීම, රජයේ හෝ පුද්ගලික අංශයේ දේපලකට අලාභ වුවහොත් සංවිධායක මණ්ඩලය එය ප්‍රතිපූර්ණය කිරීම යන කොන්දේසි ද ඇතුලත් කර තිබුණි.

පොලිස් යතුරුපැදි සහ නිලධාරීන් සඳහා රජයට අයවිය යුතු ගාස්තුද අයකර ගැනීමෙන් පසු යතුරුපැදි ගමන්ගන්නා මාර්ගය ආවරණය වන පොලිස් කොට්ඨාස වල රථවාහන නිලධාරීන්ටද ඒ පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබාදී මාර්ග ආරක්ෂාව සලසන ලෙස සහ ඔවුන් නීතියට පටහැනිව කටයුතු කරන්නේ නම් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසටද දැනුවත් කරන ලදී. ඒ අනුව මෙය හුදෙක් පුද්ගලික

සංවිධානයක් විසින් සමාජ සත්කාරයක් සඳහා සංවිධානය කරන ලද යතුරුපැදි සවාරියක් බව අවධාරණය කල යුතුය.

කෙසේ වුවද මේ පිළිබඳව මහජනයාගෙන් එල්ලවූ විරෝධය සහ කොන්දේසි වලට පටහැනිව කටයුතු කිරීම මත කල්පිටිය සිට අනුරාධපුර දක්වා පැවැත්වීමට තිබූ යතුරුපැදි සවාරිය නතර කිරීමට පොලිසිය විසින් තිරණය කරන ලදී. එසේම ඔවුන් නීතියට පටහැනි ලෙස කටයුතු කර තිබේ නම් ඊට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරෙනු ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**